කාර්යසාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
Performance Report
2022

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

வர்த்தக,வணிக மற்றும் உணவு பாதுகாப்பு அமைச்சு

MINISTRY OF TRADE, COMMERCE AND FOOD SECURITY

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
අංක 492, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

පටුන

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම 1

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3. ප්‍රධාන කාර්යයන් 3

1.4. සංවිධාන සටහන 4

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 5

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අරමුදල් 5

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 5

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. ප්‍රගතිය 6

2.2. විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක 8

3. පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 12

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 13

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 14

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 15

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 16

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 16

3.7. මු.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 16

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 16

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව 17

4. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 26

5. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය 27

5.2. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 28

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 29

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 29

6.3. මානව සම්පත් සංවර්ධනය 29

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 31

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැදින්වීම

2019.12.10 දිනැති අංක 2153/12 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය ලෙස ස්ථාපිත වූ මෙම අමාත්‍යාංශය පසුව 2020.08.29 දිනැති අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා 2020.12.11 දිනැති අංක 2205/14 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වෙළෙඳ අමාත්‍යාංශය ලෙස ස්ථාපිත වූ අතර 2021.05.27 දිනැති අංක 2281/41 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය, 2022.07.22 දිනැති අංක 2289/43 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය හා 2022.12.22 දිනැති අංක 2311/42 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය ලෙස ස්ථාපිත වී ඇත.

පාරිභෝගිකයින් ගේ අයිතීන් ආරක්ෂා කරමින් තරගකාරී දේශීය වෙළෙඳ ජාලයක් හරහා ජනතාව වෙත අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා දීම සඳහා කටයුතු කිරීම, වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් කටයුතු කිරීම, ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම, එම වෙළෙඳ ප්‍රතිපත්තිය නියාමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලාංකිකයන්ගේ එදිනෙදා පරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ජීවන තත්ත්වය ඉහළ මට්ටමකින් පවත්වාගෙනයාම සඳහා මෙම අමාත්‍යාංශය සෘජුව දායක වේ. තවද, ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන සම්බන්ධීකරණය කිරීම ද මූලිකම කාර්යයකි. එසේම ආනයන හා අපනයන කටයුතු නියාමනය සඳහා දායකත්වය සැපයීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳාම ඉහළ නැංවීමටත්, විදේශ විනිමය උත්පාදනයටත්, ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරනු ලැබේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

මෙහෙවර

වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙඳුන්, මිනුම් විද්‍යා හෝ වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා වෙළෙඳ අයිතීන් තහවුරු කරන දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම හා ඒවා නියාමනය කිරීම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ සබඳතා වැඩිකර ගැනීමට ද්විපාර්ශ්වීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් සඳහා එළඹීම තුළින් නව වෙළෙඳපළ අවස්ථා හිමි කරගැනීමටත්, ශ්‍රී ලාංකිකයින්ගේ එදිනෙදා පාරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ඉහල ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමටත් දායක වීම.

අරමුණු

1. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම.
2. වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, එළවළු, පළතුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.
3. විවෘත තරගකාරී වෙළෙඳපොළ පරිසරයක ලංකා සතොස සමාගම, සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව වැනි රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කිරීම.
4. වෙළෙඳ ප්‍රජාව මෙන්ම පාරිභෝගිකයින්ගේද ප්‍රයෝජනය පිණිස මිණුම් ඒකක ප්‍රමිතින් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික වීම.
5. ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
6. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.
7. ජාතික වශයෙන් අපනයනය දිරිමත් කිරීම සඳහා නෛතිකමය සහාය, උපදේශක දායකත්වය ලබාදීම.
8. දේශීය නිෂ්පාදනයන් හා අපනයන භාණ්ඩවල, නිසි ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාල විධිවිධානයන් සංවිධානයට මඟපෙන්වීම.
9. අධ්‍යාපනයේදී, උසස් අධ්‍යාපනය සඳහා දරු දැරියන් දිරිමත් කිරීමට අදාළ සුභසාධන ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට දායකත්වය ලබාදීම.
10. ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම.
11. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යනු ලබන අනුකූලතා තක්සේරු ප්‍රතිඵල සේවා සහතික කිරීමට අදාළ මඟපෙන්වීම.
12. ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳපළ අවස්ථා සඳහා අපනයනකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය ආයතනික පසුබිම සකස්කරදීම හා ඒ හා සම්බන්ධිත ආයතන දිරිගැන්වීම.

13. අදාළ ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වශයෙන් රටවල් සමඟ ගිවිසුම්ගතවීම් වලදී මඟපෙන්වීම හා සම්බන්ධීකරණය.
14. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පාද ක්‍රමය (GSP) අන්‍යෝන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් (NMTR), නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් (RTA) සඳහා අදාළ නෛතිකමය සම්බන්ධීකරණයට අවශ්‍ය මඟපෙන්වීම.

1.3. ප්‍රධාන කාර්යයන්

1. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වෙළෙඳ විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
2. ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන්, ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
4. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ඇති කිරීමට අදාළව සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
5. දේශීය පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මිල පාලනයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන සැලැස්වීම.
6. දේශීය වෙළෙඳපළ තුළ ඇතිවන මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම.
7. ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන්කිරීම සඳහා වූ කාර්ය සාධක බලකායට පූර්ණ දායකත්වයක් ලබාදීම.
8. ලෝක වෙළෙඳපොළ තුළ නව අපනයන අවස්ථා හඳුනාගැනීමට මෙන්ම නව ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා පිළිබඳ ගවේශණය කිරීමට ආයතන දිරිමත් කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

1.4. සංවිධාන සටහන



*කනතුරු අභිමිවූ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වරුන් සම්බන්ධව කටයුතු කිරීම යටතේ මෙම නිලධාරීන්ට පෞද්ගලික වන සේ අනුමත කර ඇත

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටු කරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හතරකි.

- ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
- මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
- වාණිජ දෙපාර්තමේන්තුව
- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන හා අරමුදල්

අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටු කරලීමට අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන නවයකි.

- සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව
- සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
- සීමාසහිත ලංකා සතොස සමාගම
- අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
- ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
- සමුපකාර සේවක කොමිෂන් සභාව
- ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
- ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

1.7.1. විදේශ ආධාර ලබන ව්‍යාපෘති

අ) ව්‍යාපෘතියේ නම

බුද්ධිමය දේපළ කාර්යාලයීය කටයුතු ඩිජිටල්කරණය.

ආ) දායක නියෝජිතායතනය

ලෝක බුද්ධිමය දේපළ සංවිධානය හා ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම

රු.මි. 90

ඈ) ව්‍යාපෘති කාල සීමාව

වර්ෂ 2022-2023

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. ප්‍රගතිය

1. **ආහාර අර්බුදයට පිළියම් යෙදීමේ දී මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග**

   විවෘත ගිණුම් ක්‍රමය (OAPT) යටතේ අත්‍යවශ්‍ය ආහාර වර්ග 10 ක් ආනයනය කර සාධාරණ මිලකට පාරිභෝගික ජනතාව වෙත ලබා දීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම. මේ හේතුවෙන් අදාළ භාණ්ඩ වර්ග වල මිල අවම මට්ටමකින් පවත්වා ගැනීමට හැකි විය.

   ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (ICL) හරහා අත්‍යවශ්‍ය ආහාර වර්ග 15ක් ආනයනය කිරීමේ කටයුතු සිදු කරන ලදී. මේ යටතේ දැනට ආනයනකරුවන් 185 දෙනෙකු සඳහා නිර්දේශ ලබා දීමට මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇති අතර අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙක්ට්‍රික් ටොන් 145,491 ක ප්‍රමාණයක් 2023.01.25 දින වන විට ආනයනය කර ඇත.

   ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව හරහා විදේශයන්ගෙන් ලැබෙන ආධාර දිස්ත්‍රික් ලේකම්වරුන් මඟින් දිළිඳු ජනතාව අතර බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලදී.

2. **ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අමාත්‍යාංශ ඒකාබද්ධව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩපිළිවෙළ**

   රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා සහල් ආනයනය කිරීමට අනුමැතිය ලබා දී තිබූ පරිදි සහල් මෙට්‍රික් ටොන් 115,169ක් ආනයනය කළ අතර බිත්තර ආනයනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත.

   වෙළෙඳපොළ තුළ අනවශ්‍ය ලෙස භාණ්ඩ මිල ඉහළ යන අවස්ථා වලදී ඒ පිළිබඳව විශ්ලේෂණය කර අවශ්‍ය අවස්ථාවන්හී දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් උපරිම සිල්ලර මිල (MRP) නියම කිරීම සිදු කර ඇති අතර ඉදිරියේ දී ද මෙම කාර්යය සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීම.

3. **ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සැකසීමට පියවර ගැනීම.**
   ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු සිදු කිරීමේ දී ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් නොමැති වීමේ අඩුපාඩුව හඳුනා ගැනීමත් සමඟ වෙළෙඳ අමාත්‍යවරයා විසින් 2021.08.21 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/1206/513/004 අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව සාමාජිකයින් 25 දෙනෙකුගෙන් සමන්විත විද්වත් උපදේශක කමිටුවක් පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබූ අතර එම විද්වත් කමිටුව විසින් කෙටුම්පත් කරන ලද ප්‍රතිපත්ති රාමුව (Policy Framework) ඇතුළු කරුණු පදනම් කර ගනිමින් තාක්ෂණික වාර්තාවක් සකස් කළ යුතු බවට තීරණය විය. ඒ අනුව, මේ සඳහා පත් කර ගත් කමිටුව මේ වන විට එම වාර්තා ද්විත්වය කෙටුම්පත් කර ඇත.

4. ලංකා සතොස ආයතනය විසින් අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ හිහතාවයකින් තොරව මහජනතාව වෙත ලබා දීම අරමුණු කර ගනිමින් ටෙන්ඩර් ක්‍රමයට සුදුසු සැපයුම්කරුවන් තෝරා ගත් අතර එම භාණ්ඩ ලංකාව පුරා ව්‍යාප්ත 446ක් වන ලංකා සතොස අලෙවිසැල් ජාලය මඟින් පාරිභෝගික ජනතාව වෙත අලෙවි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා සහය ලබා දෙන ලදී.

5. ලංකාව පුරා පිහිටි ලංකා සතොස අලෙවිසැල් හා සමුපකාර අලෙවිසැල් ජාලය මඟින් ග්‍රාමීය මට්ටම දක්වා මහජනතාවට අවශ්‍ය අත්‍යවශ්‍ය භාණ්ඩ අවම මිල ගණන් යටතේ මිලදී ගැනීමට හා භාණ්ඩ හිඟයකින් තොරව මිලදී ගැනීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී.

6. **ආනයනික අත්‍යවශ්‍ය භාණ්ඩ වරායෙන් නිදහස් කර ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් ලබා ගැනීමට කටයුතු කිරීම.**

2021.09.24 වන දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ජීවන වියදම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණය පරිදි 2022 වර්ෂයේ දී පළමු අර්ධය තුළ දී ද ආනයනික අත්‍යවශ්‍ය භාණ්ඩ වරාය පර්යන්ත වලින් නිදහස් කර ගැනීමට අවශ්‍ය වන ඩොලර් ලබා ගැනීමට සහය වීම. එනම් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කරනු ලබන ආනයනික සංගමය ඇතුළු ආනයනකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් අදාළ ඇමෙරිකානු ඩොලර් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම සිදු කර ඇති අතර, එම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

7. **ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම**

ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1 ක ණය පහසුකමක් ලැබුණු අතර, එම මුදල් පහත පරිදි භාණ්ඩ ආනයනය සඳහා වෙන්කරන ලදී.

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය	ඇ.ඩො.මි. 371
කර්මාන්ත අමු ද්‍රව්‍ය	ඇ.ඩො.මි. 194
ඉන්ධන	ඇ.ඩො.මි. 200
අත්‍යවශ්‍ය ඖෂධ	ඇ.ඩො.මි. 200
විවිධ	ඇ.ඩො.මි. 35

ආනයනකරුවන් විසින් ආනයනය සඳහා ඉල්ලුම් කරන ලද භාණ්ඩ ප්‍රමාණයන් නිර්දේශකර 2022.10.15 දින දක්වා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වෙළෙඳපොළට සැපයීමට සහය වන ලදී.

8. **විවෘත ගිණුම් ක්‍රමය යටතේ අත්‍යවශ්‍ය ආහාර ආනයනය සඳහා නිර්දේශ ලබාදීම**

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව පාරිභෝගික ජනතාවට සැපයීම සඳහාත් රටතුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ඉල්ලුමට සරිලන සැපයුම පවත්වාගෙන යාමට හා මිල ගණන් ඉහළ යාමෙන් ඇතිවන තත්ත්වයන් පාලනය කර පාරිභෝගිකයාට සහන සැලසීම සඳහා 2022.07.01 දින සිට 2022.09.30 දින දක්වා විවෘත ගිණුම් යටතේ අත්‍යවශ්‍ය ආහාර වර්ග 10 ක් ආනයනයට නිර්දේශ ලබා දී ඇත.

9. පාරිභෝගික සේවා අධිකාරිය මඟින්, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල හිඟයක් පැවතීම හේතුවෙන් නිෂ්පාදන වල මිල ඉහල නැංවීම, එකම භාණ්ඩය විවිධ මිල ගණන් යටතේ අලෙවි කිරීම වැනි වෙළෙඳ අක්‍රමිකතා සඳහා නීතිමය පියවර ගැනීමටත්, එවැනි අක්‍රමිකතා වැළැක්වීමට ක්‍රමවේදයක් සකසා අත්‍යවශ්‍ය භාණ්ඩ මිල උච්චාවචනයන් හා අසාමාන්‍ය මිල ඉහල යාම් පාලනය කිරීමේ ක්‍රමවේද තුළින් පාරිභෝගිකයාට සහන සැලසීම.

10. **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පාරිභෝගික සේවා කමිටු පිහිටුවීම**

අප රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදය හේතුවෙන් ආහාර හා අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ලබා ගැනීමේ අර්බුදයක් මතු වී තිබූ අතර මේ වනවිටත් එම තත්ත්වය පවතී. එමඟින් ජනතාව දැඩි අපහසුතාවයකට මුහුණපා ඇති අතර ඉදිරියේදී මන්දපෝෂණ තත්ත්වයකට පත් වීමට ද මෙය හේතු වනු ඇත. එබැවින් පාරිභෝගික ජනතාවට සහන සැලසීමේ අරමුණින් වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ මේ වනවිට සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් පාරිභෝගික කමිටු පිහිටුවීමට කටයුතු කර ඇති අතර මේ වන විට පාරිභෝගික සේවා කමිටු 323ක් ස්ථාපිත කර ඇත.

11. **ආහාර සුරක්ෂිතතා කමිටුව ක්‍රියාත්මක කිරීම**

අමාත්‍යමණ්ඩල අනුමැතිය යටතේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වන මෙම කමිටුව මඟින් ජීවන වියදම් කමිටුවට නිර්දේශ ඉදිරිපත් කිරීම, ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම සඳහා අදාළ අමාත්‍යාංශ හා ආයතන සම්බන්ධීකරණය හා ඉදිරිපත්වන ගැටළු වලට විසඳුම් හා නිර්දේශ ලබාදීම සිදුකළ අතර, මෙම කාර්යභාරය මේ වනවිට ආහාර සුරක්ෂිතතා කමිටුව වෙත පවරා ඇත.

2.2. විශේෂ ජයග්‍රහණ අභියෝග හා ඉදිරි ඉලක්ක

ජයග්‍රහණ

1. විවෘත ගිණුම් ක්‍රමය (OAPT) යටතේ අත්‍යවශ්‍ය ආහාර වර්ග 10 ක් ආනයනය කර සාධාරණ මිලකට පාරිභෝගික ජනතාව වෙත ලබා දීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම. මේ හේතුවෙන් අදාළ භාණ්ඩ වර්ග වල මිල අවම මට්ටමකින් පවත්වා ගැනීමටත්, වෙළෙඳපොළ සමතුලිතතාවය පවත්වා ගැනීමට හැකි වීම.

2. ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (ICL) යටතේ අත්‍යවශ්‍ය ආහාර වර්ග 15ක් ආනයනය කිරීමේ කටයුතු සිදු කරන ලදී. මේ යටතේ ආනයනකරුවන් 185 දෙනෙකු සඳහා නිර්දේශ ලබා දීමට මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇති අතර අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මෙක්ට්‍රික් ටොන් 145,491 ක ප්‍රමාණයක් 2023.01.25 දින වන විට ආනයනය කිරීමට හැකි වීම.

3. අමාත්‍යමණ්ඩල අනුමැතිය යටතේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ආහාර සුරක්ෂිතා කමිටු ක්‍රියාත්මක කරන ලදී. මෙම කමිටුව මඟින් ජීවන වියදම් කමිටුවට නිර්දේශ ඉදිරිපත් කිරීම, ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම සඳහා අදාළ අමාත්‍යාංශ හා ආයතන සම්බන්ධීකරණය හා ඉදිරිපත්වන ගැටළු වලට විසඳුම් හා නිර්දේශ ලබාදීම සිදුකිරීමට සෘජුව දායකත්වයක් ලබාදීම.

4. වාණිජ දෙපාර්තමේන්තුව මඟින් අපනයන සහ ආනයන ආශ්‍රිතව රටවල් අතර ඇති වූ ආරවුල් සාමකාමී අයුරින් විසඳා ගැනීම සඳහා ඊට අදාළ පාර්ශ්වයන්ගෙන් නිරීක්ෂණ ලබා ගැනීමට සමාගම් 48 කට සහාය ලබා දී ඇත.

5. වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශයන්හි සේවය කරන වාණිජ නිලධාරීන් මඟින් වෙළෙඳාම, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය යන කටයුතු සඳහා රටවල් 10ක් තුළ අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශන සහ රැස්වීම් 12 කට සහභාගී වීමට පහසුකම් සලසන ලදී. ඒ තුළින් විදේශ වෙළෙඳ සබඳතා වර්ධනය කර ගැනීමටත්, ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට අපනයන අවස්ථා හා විදේශ විනිමය ඉපැයීම් අවස්ථා වර්ධනය කර ගැනීමටත් අවස්ථාව සලසාදී ඇත.

6. වාණිජ දෙපාර්තමේන්තුව මඟින් ධීවර සහනාධාර පිළිබඳ ගිවිසුම ක්‍රියාත්මක කර ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වෙමින් පවතින රටවලට ඔවුන්ගේ සුවිශේෂී ආර්ථික කලාපය තුළ නීතිවිරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ ධීවර කටයුතුවල සහ අධික ලෙස මසුන් ඇල්ලීමේ යෙදී සිටින ධීවරයින්ට ලබා දෙන ආධාර ඉවත් කර ගැනීමට වසර 2ක සහන කාලයක් ලබා ගැනීමට කටයුතු කර ඇත.

7. දේශීය වෙළෙඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ පහසුකම් සපයනු ලබන ලෝක බුද්ධිමය දේපළ සංවිධානය මඟින් පරිපාලනය කරනු ලබන මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට කටයුතු කර ඇත.

මැඩිරිඩ් සන්ධාන පත්‍රය යටතේ ගොනු කෙරෙන දේශීය හා විදේශීය අයදුම්පත් සහ විදේශීය ආයෝජන ප්‍රවර්ධනය මඟින් ජාතික ආදායම් වර්ධනය සඳහා දායක වී ඇත.

8. මාර්ගගත ක්‍රමයට වෙළෙඳ කටයුතු සිදුකරන ව්‍යාපාරික ප්‍රජාව සඳහා අනුකූලතා මාර්ගෝපදේශය අනිවාර්ය කිරීමට කටයුතු කර ඇත. 2020 දී ඇති වූ COVID වසංගත තත්ත්වය තුළ, ශ්‍රී ලාංකික පාරිභෝගිකයින්ගෙන් බහුතරයකට අන්තර්ජාලය හරහා ඇණවුම් කිරීම කෙරෙහි විශ්වාසය තැබීමට සිදු වූ අතර, ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයේ (ITC) සහාය ඇතිව මෙම අංශය විධිමත් කිරීම සඳහා එනම් අන්තර්ජාලය භාවිතා කර ව්‍යාපාරික කටයුතු කරන වෙළෙඳ ප්‍රජාව සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම සිදුකරන ලදී. ක්ෂේත්‍රය පිළිබඳව කටයුතු කරන නිලධාරීන් හා ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් විශේෂඥ කමිටුවක් විසින් ශ්‍රී ලාංකීය සන්දර්භයට ගැලපෙන පරිදි මාර්ගෝපදේශ වෙනස් කරන ලදී. අන්තර්ජාල වෙළෙඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර කෙටුම්පත් කළ මාර්ගෝපදේශය ඔවුන් වෙත ඉදිරිපත් කර ඒ සඳහා ඔවුන්ගේ අදහස් ද ලබා ගෙන වැඩිදියුණු කළ මාර්ගෝපදේශ අධ්‍යක්ෂ මණ්ඩලය මේ වන විට අනුමත කර ඇත.

9. මාර්ගගත ක්‍රමයට වෙළෙඳ කටයුතු සිදුකරන ව්‍යාපාරික ප්‍රජාව ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කර ඇත. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 27 වන වගන්තිය යටතේ, වෙළෙඳ ප්‍රජාව ලියාපදිංචි කිරීම සඳහා ජා ඇල-ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී නියමු ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර සැලසුම් කළ පරිදි ව්‍යාපාර ලියාපදිංචිය සිදුකරන ලදී .

අභියෝග.

- 2022 වර්ෂයේ මැද භාගය වනතෙක් කොවිඩ් 19 ලෝක වසංගත තත්ත්වයේ බලපෑම හේතුවෙන් දේශීය හා විදේශීය වෙළඳ කටයුතුවලට බාධා එල්ලවීම නිසා අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අපහසු විය.

- රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වියදම් සීමා කිරීමේ චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව කටයුතු කිරීමට සිදුවීම හේතුවෙන් සැලසුම් කරන ලද වැඩසටහන්/ ව්‍යාපෘති නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.

- අමාත්‍යාංශයේ සේවක පුරප්පාඩු බොහොමයක් සඳහා නවක උපාධිධාරීන් බඳවාගෙන ඇති අතර ඔවුන් පුහුණු කරමින් අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු කිරීමට සිදුවීම.

ඉදිරි ඉලක්ක

1. වාණිජ දෙපාර්තමේන්තුව හරහා ශ්‍රී ලංකාව තුළ වැඩසටහන්, වැඩමුළු සහ රැස්වීම් පැවැත්වීම සහ සපයන සේවාවන් පිළිබඳව අපනයනකරුවන්, වෙළෙඳ ප්‍රජාව ඇතුළුව සමස්ත මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම තුළින් වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීම සහ විදේශීය විනිමය ඉපැයීමේ අවස්ථා වර්ධනය කර ගැනීමට අපේක්ෂිතය.

2. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සංචිත පවත්වාගෙන යාම හා බෙදාහැරීම තුළින් වෙළෙඳ පොළ තුළ පාරිභෝගිකයාගේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ගුණාත්මක බවින් යුතු අත්‍යවශ්‍ය භාණ්ඩ හා පවතින වෙළෙඳපොළ හිඟතාවයන්ට රජයේ සෘජු මැදිහත් වීම යටතේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව වඩාත් වගවිමකින් කටයුතු කල හැකි පරිදි හදිසි අවශ්‍යතාවයන් කළමනාකරණය කරගැනීමට අවශ්‍ය ආහාර සංචිත පවත්වාගෙන යාම.

3. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් එළවළු පළතුරු ගබඩා කිරීම සඳහා දඹුල්ල ප්‍රදේශයේ මෙ.ටො 5000ක ධාරිතාවකින් යුත් උෂ්ණත්ව පාලිත ගබඩා සංකීර්ණය ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම හා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

4. ලෝක ආහාර වැඩසටහන යටතේ මෙරටට ලබා දෙනු ලබන ආහාර ද්‍රව්‍ය නිෂ්කාශනය සිදු කර බෙදා හැරීමට කටයුතු කිරීම.

5. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් මෙ. ටො 8000ක සහල් සංචිතයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

6. වාණිජ දෙපාර්තමේන්තුව මඟින් 2023 Canton Fair ප්‍රදර්ශනය (චීනය), 2023 Gulfood ප්‍රදර්ශනය (ඩුබායි), ඇඟලුම් ප්‍රභවයන් පිළිබඳ ප්‍රදර්ශනය (පැරිස්), Foodex 2023- (ජෙඩා), එක්සත් රාජධානියේ ස්වභාවික සහ කාබනික නිෂ්පාදන ප්‍රදර්ශනය (යුරෝපය), සිංගප්පූරු ෆින්ටෙක් උත්සවය, දකුණු කොරියාවේ ආනයන භාණ්ඩ ප්‍රදර්ශනය, ලෝක තෑගි භාණ්ඩ ප්‍රදර්ශනය (ඉන්දියාව) යන වෙළෙඳ ප්‍රදර්ශන හා වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.

7. ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මඟින් බුද්ධිමය දේපළ ලියකියවිලි ඩිජිටල්කරණය මඟින් ඵලදායී ලිපිගොණු කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම, වෙළෙඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ඇතුළත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම, සංයුක්ත පරිපථ (Integrated Circuit (IC)) ලියාපදිංචි කිරීම පිළිබඳ මාර්ගෝපදේශයක් සකස් කිරීම, කාර්මික සැලසුම් ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් (Hague) පද්ධතියට ප්‍රවේශ වීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට කටයුතු කිරීම, ශ්‍රී ලංකාව තුළ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පහසුකම ස්ථාපනය කිරීමට කටයුතු කිරීම, ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වන IPAS (කාර්මික දේපළ පරිපාලන පද්ධතිය) එහි ආසන්නතම ඉහළ යාවත්කාලීන කිරීම දක්වා වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

8. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා මාර්ගගත ගෙවීම් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමට කටයුතු කිරීම, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ නවෝත්පාදනයන් සහ වාණිජකරණය වේගවත් කිරීම සඳහා බුද්ධිමය දේපළ පරිසර පද්ධතියක් ගොඩනැගීමේ ව්‍යාපෘතිය සඳහා වැඩමුළු පැවැත්වීමට කටයුතු කිරීම, විද්‍යුත් මාධ්‍යවල විකාශනය වන ගීත හා සංගීතමය කලා නිර්මාණ සඳහා මුල් නිර්මාණ කරුවන්ට කතෘ භාගය ගෙවීම සම්බන්ධව යාන්ත්‍රණය තව දුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කිරීම, ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා Lanka Government Cloud සේවාදායක පහසුකම ලබා ගැනීමට කටයුතු කිරීම හා බාහිර ප්‍රදර්ශන සහ ප්‍රවර්ධනාත්මක වැඩසටහන් සඳහා ක්‍රියාශීලිව සම්බන්ධ වීමට අපේක්ෂිතය.

9. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් සෞඛ්‍යයට අහිතකර පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපලට ඇතුළු වීම වැලැක්වීමට පියවර ගැනීම, පාරිභෝගික ද්‍රව්‍ය සඳහා සෞඛ්‍ය ආරක්ෂිත බව තහවුරු කෙරෙන ප්‍රමිතකරණයක් ඇති කිරීම, පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් භාණ්ඩ හා සේවාවන්ගේ සාධාරණ මිල තහවුරු කිරීම, ව්‍යාපාරික ප්‍රජාව, පාසල් සහ විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම, නෛතික ප්‍රතිපාදන වඩාත් ශක්තිමත් කිරීමට අධිකාරී පනත සංශෝධනය කිරීම හා ඩිජිටල් සේවා කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පාරිභෝගික සේවා කමිටු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම මඟින් වෙළෙඳපොළ හැසිරීම පිළිබඳ ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීම, නිෂ්පාදනයන් වෙළෙඳපොළ වෙත කඩිනමින් යොමුකිරීම, පාරිභෝගිකයා හා නිෂ්පාදකයන් අතර සමීප සබඳතාවයන් තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂිත වේ.

11. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සැපයීමට කටයුතු කිරීම. ද්‍රව්‍යයක හෝ නිෂ්පාදිතයක සම්භවය කිසියම් නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක බවත්, එහි විශේෂ ගුණාංග, ගති ලක්ෂණ හා කීර්තිනාමයක් එම භූගෝලීය සම්භවයේ හේතුවෙන් ඇතිවී ඇති බවත් පාරිභෝගිකයන්ට හා වෙළෙඳුන්ට පෙන්නුම් කිරීම සඳහා භූගෝලීය දර්ශක භාවිතා කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ විශේෂ ක්‍රමවේදයක් මෙතෙක් නොපැවති අතර, වෙළෙඳ ලකුණු යටතේ සහතික ලකුණක් ලෙස ලියාපදිංචි කිරීම පමණක් සිදු කර තිබේ. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම මඟින් ලංකා තේ, ලංකා කුරුඳු ආදී භූගෝලීයව වැදගත්කම් දරණ ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා පුළුල් විදේශීය වෙළෙඳපළක් ඇති කර ගැනීමට අපේක්ෂිත ය.

12. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ආසියා පැසිෆික් ප්‍රතීතන සහයෝගීතාවයේ (APAC) සහ ලෝක ප්‍රතීතන සංවිධාන 2 ක එනම්, අන්තර්ජාතික රසායනාගාර ප්‍රතීතන සහයෝගිතාව (ILAC) සහ ජාත්‍යන්තර ප්‍රතීතන සංසදය (IAF) හි පූර්ණ සාමාජිකයෙක් විය. තවද ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන සේවාව ලබාගැනීම සඳහා දකුණු ආසියාතික මෙන්ම මැදපෙරදිග රටවල් වලින්ද විමසීම් සිදුකර ඇති අතර, මේ වන විටත් ඒ සඳහා කටයුතු කරමින් පවතී. මෙම කාර්යය සඳහා වැඩි අවස්ථා ලබාගැනීමට කටයුතු කිරීම තුළ ශ්‍රී ලංකාවට ඉහළ විදේශ විනිමය ඉපැයීමක් අපේක්ෂා කළ හැකිය.

13. ආනයනය කරන ලද සහ දේශීයව නිපදවන ආහාරමය හා ආහාරමය නොවන ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහතික කිරීම පිණිස පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් දත්ත පද්ධතියක් සකස් කිරීමට අපේක්ෂිතය.

14. සමූපකාර ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා සමූපකාර සංවර්ධන බැංකුවක් පිහිටුවීමට අපේක්ෂිතය.

ඒ.එම්. පී.එම්. බී. අතපත්තු
ලේකම්
වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

ඒ.එම්.පී.එම්.බී. අතපත්තු.
ලේකම්
වෙළෙඳ, වාණිජ හා
ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

3. පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කර්තව්‍ය 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		5,857,618,948	4,863,029,004	ඒසිඒ-3
-	තැන්පතු		62,363,639	9,567,586	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		24,868,080	7,256,343	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		5,944,850,666	4,879,852,933	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		5,944,850,666	4,879,852,933	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		87,000	60,401	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		5,944,763,666	4,879,792,532	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
158,310,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	133,614,037	184,173,938	
198,820,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	196,087,581	201,761,003	ඒසිඒ-2(ii)
3,678,400,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	3,288,534,934	423,923,602	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
4,035,530,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		3,618,236,552	809,858,543	
	මූලධන වියදම්				
62,900,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	6,697,376	57,975,969	
5,650,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	3,813,750	29,335,063	
70,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	47,349,052	426,679,806	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,900,000	හැකියා වර්ධනය	14	646,330	348,183	
4,238,000,000	වෙනත් මූලධන වියදම්	15	4,152,583,265	4,078,419,811	
4,378,450,000	මුළු මූලධන වියදම් (උ)		4,211,089,773	4,592,758,832	
	තැන්පතු ගෙවීම්		39,891,620	471,915	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		23,390,465	5,387,449	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		63,282,084	5,859,364	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		7,892,608,410	5,408,476,739	
8,413,980,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(1,947,844,744)	(528,684,206)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(1,947,844,744)	(528,684,206)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			-	-	

2022 /09/21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 06/2022 අනුව 2022 වර්ෂයේ පැවති සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ වැය විෂයන් (වැය ශීර්ෂ 438) වෙළඳ,වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයට මාරු කරන ලදී.

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	197,047,128	112,636,540
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	16,193,721	17,671,336
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**213,240,849**	**130,307,876**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(16,265,370)	8,229,876
දේපළ පිරියත හා උපකරණ සංචිතය		197,047,128	112,636,540
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
පංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	32,459,091	9,441,460
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		
මුළු වගකීම්		**213,240,849**	**130,307,876**

පිටු අංක 07 සිට 50 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 51 සිට 58 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2023-02-27	දිනය : 2023-02-27	දිනය : 2023/02/24
ලේකම්		නෙලූකා පටබැඳිගේ
වෙළෙඳ, වාණිජ හා		ප්‍රධාන ගණකාධිකාරී
ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය		වෙළෙඳ අමාත්‍යාංශය
		අංක.492, ආර්. ඒ. ද මැල් මාවත,
		කොළඹ 03.

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කණ්ඩායම	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	29,016,058	5,666,126
අග්‍රිම ලැබීම්	5,857,618,948	4,863,029,004
අත්තිකාරම් අයකර ගැනීම්	37,779,060	2,050,657
තැන්පතු ලැබීම්	42,149,886	9,567,586
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**5,966,563,952**	**4,880,313,374**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	291,199,065	287,849,018
සහනාධාර සහ මාරුකිරීම්	1,364,201,178	141,590
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	75,771,161	203,658,472
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	87,000	60,401
අත්තිකාරම් ගෙවීම්	40,526,846	2,465,919
තැන්පතු ගෙවීම්	23,261,344	471,915
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,795,046,593**	**494,647,315**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,171,517,359**	**4,385,666,059**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	40,399,458	487,489,948
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**40,399,458**	**487,489,948**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(40,399,458)**	**(487,489,948)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**4,131,117,901**	**3,898,176,111**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	4,131,117,900	3,898,176,111
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**4,131,117,900**	**3,898,176,111**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(4,131,117,900)**	**(3,898,176,111)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2022 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2021 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් එකතු කිරීම අදාළ නොවේ.

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම (රු.මිලියන)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන (රු.මිලියන)	අවසාන ප්‍රතිපාදන (රු.මිලියන)		
පුනරාවර්තන	4,011.75	4,035.53	3,618.24	**89.65%**
ප්‍රාග්ධන	4,370.25	4,378.45	4,210.55	**96.1%**

3.7. මු.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

2022.01.03 දින රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් සඳහා වැටුප් හා දීමනා ගෙවීම සඳහා එම අමාත්‍යාංශයෙන් ලබා දෙන ලද ප්‍රතිපාදන පහත පරිදි වේ.

130-1-2-0-1001- රු.මි. 39.7
130-1-2-0-1003- රු.මි. 20.3

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.මිලියන

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ-අරමුදල	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ-ශීර්ෂය	197.04	197.04	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

*භාණ්ඩ වට්ටෝරු ලේඛනය අනුව ශේෂය ඉදිරිපත් කර ඇත.

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TAC/F/MT/2022/FS/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 31 දින

ලේකම්,

වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

ශීර්ෂය 116 - වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 116 - වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

සමාලෝචිත වර්ෂයේ වෙළඳ අමාත්‍යාංශයට පැවරුම් කරන ලද රු. 2,157,470 ක් වූ මෝටර් රථයක් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශයට ඒකාබද්ධ වූ රාජ්‍ය අමාත්‍යාංශයට අයත් රු.15,940,000 ක් වූ වාහන 02 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ (CIGAS වාර්තාවේ) ඇතුලත් කර තිබුණු අතර, එය රාජ්‍ය අමාත්‍යාංශයට අයත්ව තිබූ බවට හෝ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 07 ක් සඳහා පරිපූරක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණද ඒවායේ ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 48 ත් සියයට 100 ත් අතර පරාසයක පැවතුණි. තවද මින් සියයට සියයක් ඉතිරිවීම් පැවති 116-01-01-2001 දරන වැය විෂය සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් නොතිබුණු අතර පරිපූරක ප්‍රතිපාදන මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

116-01-02-1409 වැය විෂය යටතේ ඉතිරිය ඉක්ම වූ බැරකම් රු. 531,168 ක් පැවති අතර මේ සම්බන්ධයෙන් මු.රෙ. 94 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ)	මුදල් රෙගුලාසි 1646	සෑම වාහනයක් සඳහාම ධාවන සටහන් ඊළඟ මාසයේ 15 දිනට පෙර ඉදිරිපත් කලයුතු වුවද සමාලෝචිත වර්ෂයේදී සංචිත වාහන 07 ක් සඳහා මාස 21 ක ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/ 2020 හි 04 ඡේදය	ඉදිරි වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් අදාල ආයතන වෙත යොමුකල යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල වෙළඳ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් ඒ අයුරින් කටයුතු කර නොතිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	
	(i) 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල පමාවකින් පසුව හා කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හා එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත පරීක්ෂා කලයුතු වුවත් 2022 වසර තුල හෝ ඊට පෙර වෙළඳ අමාත්‍යාංශයේ සංචිත වාහන 7 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.
	(ii) 5.1 ඡේදය	ඉන්ධන ප්‍රමාණය සහ ධාවනය කරන ලද දුර ප්‍රමාණයන් ලොග් සටහන් පොතේ දිනපතා ඇතුලත් කලයුතු අතර, 06 ඡේදය ප්‍රකාරව සංචිත වාහන සඳහා අනුයුක්ත කර ඇති සියලුම රියදුරන් පොදු 268 හා දෛනික ධාවන සටහනේ 268 (අ) වැනි පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව අදාල මාසය වෙනුවෙන් වාහනය ධාවනය වූ දුර ප්‍රමාණය ආදිය දැක්වෙන සාරාංශ සටහන දිනපතා පිරවිය යුතු වුවත් අමාත්‍යාංශයේ සංචිත වාහන 06 ක එසේ සිදුකර නොතිබුණි.

2.4 අවධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/ 2018 ට පටහැනි ලෙස ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරියෙකුට 2021 වර්ෂය තුළ මාසිකව ඉන්ධන ලීටර් 140 බැගින් එකතුව රු. 103,650 ක ඉන්ධන දීමනාවක්ද, මාසිකව රු. 8,000 බැගින් එකතුව රු. 74,333 ක දුරකථන දීමනාවක් ගෙවා තිබිණි.

(ආ) 2020 මැයි 12 දින සිට හා 2021 මාර්තු 22 දක්වා අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස පත්ව සිටි නිලධාරීන් දෙදෙනෙක් වෙත මාසික වැටුප්, ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස පිළිවෙලින් රු. 1,258,526 ක් හා රු. 1,564,328 ක මුදලක් ගෙවා තිබුණද සේවයට වාර්තා කිරීම සම්බන්ධයෙන් පැමිණීම්, පිටවීම් පිළිබඳ ලේඛන වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) KR 1491 අංක දරන සංචිත වාහනය සඳහා සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ ඉන්ධන ලබාදී තිබුණද එම වාහනයට අදාලව ධාවන සටහන් ලැබී තිබුණේ මාස 07 ක අදාළව පමණි. විගණනයට ඉදිරිපත් කල ධාවන සටහන්වල අඩංගු විස්තර අනුව එම වාහනය එම කාලය තුල ලේකම්තුමියගේ නිල නිවස හා ලේකම්තුමියගේ රාජකාරී සඳහා යොදවා ගෙන තිබූ අතර 2021 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008/(VI) අනුව මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය සඳහා අදාල මාසික ඉන්ධන දීමනාව වූ රු. 26,620 ක් ලබා ගනිමින් සිටියදී සංචිත වාහනය සඳහා ඉන්ධන ඇණවුම් මඟින් රු. 156,470 ක පෙට්‍රල් ලීටර් 1,006 ක ප්‍රමාණයක් ලේකම්තුමියගේ රාජකාරී සඳහා නැවත ලබාදී තිබුණි.

2.5 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

නිලධාරීන් 02 දෙනෙක් අවස්ථා දෙකකදී එකතුව රු. 135,000 ක් වටිනා අත්තිකාරම් ලබාගෙන තිබුණද අත්තිකාරම් ලබාගත් අවශ්‍යතාවය ඉටු නොකර ලබා දුන් මුදල නැවත පියවීම සඳහා දින 09 ත් 36 ත් අතර සැලකියයුතු කාලපරාසයක් ගතකර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ අරමුණු අතුරින් පහත දැක්වෙන ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(අ) ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් තුලින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගික අයිතීන් සුරැකෙන පරිදි වෙළඳපොල හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුලින් අපනයනය දිරිමත් කිරීම.

(ආ) අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණය සැකසීම.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඉටුකර ගැනීම සඳහා සැලසුම් කල ප්‍රධාන කාර්යයක් වූ ශ්‍රී ලංකාව තුල මෙට්‍රික් ටොන් 8000 ක ආරක්ෂක සහල් සංචිතයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 50 ක් හා පෙර වර්ෂයේ රු. මිලියන 200 ක් ප්‍රතිපාදන ලෙස ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණද මේ සම්බන්ධ කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයෙත් පෙර වර්ෂයෙත් ඉටු වී නොතිබුණි. තවද මේ සම්බන්ධව අමාත්‍යාංශයේ අධීක්ෂණ කාර්යයද නිසි ලෙස සිදු වී නොතිබුණි.

(ආ) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව හාර අරමුදල යටතේ මිහින්තලේ විසල් වෙළඳ නගර ව්‍යාපෘතිය,නුවරඑළිය පෛව පද්ධති තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ විදේශ භාෂා විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීම යන ව්‍යාපෘති 3 ආරම්භ කිරීම සිදු කල යුතු බවට අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණු නමුත් ව්‍යාපෘතියට අදාල ඉඩම් පවරා නොදීම සහ අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතිය නොලැබීම මත මහපොළ හාරකාර මණ්ඩලයේ තීරණය ප්‍රකාරව මෙම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි. තවද මිහින්තලේ විසල් වෙළඳ නගර ව්‍යාපෘතිය සඳහා අදාල මූලික කටයුතු වෙනුවෙන් වෙනුවෙන් රු.1,770,000 ක මුදලක්ද වැය කර තිබුණි.

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් ගබඩා 13 ක් නවීකරණය කිරීම

රු. 22,500,000 ක ඇස්තමේන්තුවක් සහිත මෙම ව්‍යාපෘතිය සඳහා 2021 දී අමාත්‍යාංශය විසින් රු. 50,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබිණි. සමුපකාර තොග වෙළඳ සංස්ථාව විසින් ගබඩා 13 ක් නවීකරණය සඳහා රු. 82,525,681 ක් වැයකර තිබූ අතර අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දිනට රු. 62,490,367 ක වියදම ප්‍රතිපූර්ණය කර තිබිණි. 2020 වර්ෂය තුල මෙම ගබඩා සියල්ලෙහිම නවීකරණ කටයුතු නිම විය යුතු වුවත් 2023 මැයි 16 වනතෙක් ගබඩා 04 ක කටයුතු නිම වීමේ ප්‍රගතිය සියයට 5 ත් 65 ත් අතර වීමෙන් මේ පිළිබඳ අමාත්‍යාංශයේ අධීක්ෂණ කටයුතු නිසියාකාරව සිදු වී නොමැති බව නිරීක්ෂණය විය.

තවද 2020 මාර්තු 18 දින වන විට ගබඩා 06 ක නවීකරණ කටයුතු අවසන් වී අනෙකුත් ගබඩා 07 හි නවීකරණ ප්‍රගතිය 2022 මැයි වන විට සියයට 5 සිට 95 අතර වන බව දැක්වීම නිසා අමාත්‍යාංශය විසින් සංස්ථාව වෙත ප්‍රතිපූර්ණය කලයුතු රු. 20,035,264 ක මුදල 2023 අප්‍රේල් මස නැවත භාණ්ඩාගාරයට යවා තිබිණි. මෙහි ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් හෝ ඒ පිලිබඳ පූර්ණ වාර්තාවක් අමාත්‍යාංශය ලබාගෙන නොතිබුණි.

(ආ) මඩකලපුව රජවාස ලංකා සතොස මෙගා අලෙවිසැල ඉදිකිරීමේ ව්‍යාපෘතිය පරීක්ෂාව

ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (සමාගම) විසින් මඩකලපුවේ ඉදිකරමින් පවතින රජවාස ලංකා සතොස මෙගා අලෙවිසැල ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. 47,725,462 ක් වූ අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 වන විට රු. 22,924,908 ක මුදලක් අමාත්‍යාංශය විසින් ලබා දී තිබූ අතර ගිවිසුම අනුව 2021 දෙසැම්බර් 06 දින වන විට ඉදිකිරීම නිමවිය යුතු වුවත් 2023 මැයි වන විටත් එම කටයුතු සම්පූර්ණ වී නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 සැප්තැම්බර් 28 දිනැති අමප/21/1543/313/053 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් වෙනත් අමාත්‍යාංශ හා ආයතනවලට අයත් දැනට අමාත්‍යාංශය විසින් පරිහරණය කරනු ලබන වාහන අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණද 2023 මාර්තු 15 දින වන විටත් අමාත්‍යාංශය විසින් පරිහරණය

කරනු ලබන වාහන 28 න් වෙනත් රාජ්‍ය ආයතන නමින් ලියාපදිංචි කර තිබුණු වාහන 15 ක් අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් භාවිතා කරන ලද වාහන 03 ක් මාස 05 සිට වසරක කාල පරාසයක් තුල අලුත්වැඩියාව සඳහා නියෝජිත ආයතන හා ගරාජ වෙත යවා තිබූ අතර තවත් වාහනයක් වර්ෂයක කාලයක සිට අමාත්‍යාංශ භූමියේ ගාල්කර තිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2021 දෙසැම්බර් 24 දිනැති කළමනාකරණ විගණන වක්‍රලේඛ අංක DMA/01-2019(1) ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර ඉදිරි වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම අවදානම් පාදක අභ්‍යන්තර සැලැස්මක් ලෙස සකස් කර එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2022 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම එසේ ඉදිරිපත් කර නොතිබුණි. තවද එම සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුවේදී අනුමත කරගෙනද නොතිබුණි.

බී.ජී.අයි.නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව	✔		
වෙළෙඳපොළ සමතුලිතතාව	✔		
විදේශ වෙළෙඳ කටයුතු ප්‍රවර්ධනය.		✔	
ජාතික බුද්ධිමය දේපළ ආරක්ෂණය		✔	
උසස් අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය	✔		

5. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	50-74	75-100
ඉලක්කය (1) තිරසාර ආර්ථික වර්ධනයක් ඇතිකිරීම තුළින් සහ සහනදායී මිල ක්‍රමයක් තුළින් දරිද්‍රතාව අවම කිරීමේ වැඩසටහන් අධීක්ෂණය කිරීම.	දේශීය නිෂ්පාදකයින් සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම	සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත ලබා දුන් ණය.		✔	
ඉලක්කය (2) ආහාර හිඟයක් ඇති නොවන ලෙස ආහාර සංචිත පවත්වා ගැනීම අධීක්ෂණය කිරීම.	වෙළෙඳපොළ තුල ආහාර හිඟයක් ඇතිවීම වැලැක්වීම.	එළවළු හා පළතුරු ගබඩාකර කල්තබා ගැනීමේ ශීතාගාර ගබඩා සංකීර්ණය ඉදිකිරීම හා මෙහෙයුම් ක්‍රියාවලිය.		✔	
	ආහාර ආරක්ෂිත සංචිත පවත්වාගෙන ගැනීම.	පවත්වා ගනු ලබන ආරක්ෂිත සහල් තොග.			✔
ඉලක්කය (3) වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, එළවළු, පළතුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.	අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය තුළින් වෙළෙඳපොළ භාණ්ඩ සුලබ කිරීම.	ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1 ක ණය පහසුකම යටතේ ආනයනය කරනලද අත්‍යවශ්‍ය භාණ්ඩ.			✔
		අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව පාරිභෝගික ජනතාවට සැපයීම සඳහාත් රටතුළ අත්‍යවශ්‍ය භාණ්ඩ ඉල්ලුමට සරිලන සැපයුම පවත්වාගෙන යාමට හා මිල ගණන් ඉහළ යාමෙන් ඇතිවන තත්ත්වයන් පාලනය කර පාරිභෝගිකයාට සහන සැලසීම සඳහා විවෘත ගිණුම් යටතේ අත්‍යවශ්‍ය ආහාර වර්ග 10 ක් ආනයනයට ලබාදුන් නිර්දේශ.			✔

5.2. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

1. රට තුළ පැවති ආර්ථික අර්බුදකාරී අවස්ථාවේ වුව ද අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය තුළින් වෙළෙඳපොළ සමතුලිතතාව ඇති කිරීමට හැකි වීම.

2. ඉන්දිය ණය යෝජනා ක්‍රමය හා විවෘත ගිණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් පාරිභෝගිකයාට සහන සැලසීම හා වෙළෙඳපොළ භාණ්ඩ සුලභ කිරීමට හැකි වීම.

3. පාරිභෝගික සේවා අධිකාරියේ මැදිහත්වීම තුල අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල අස්ථාවර වීම යම්තාක් දුරට පාලනය කළ හැකි වීම.

4. විදේශ වෙළෙඳපොළ අවස්ථා විවර කර ගැනීමට අපනයන කරුවන් දිරිගැන්වීමට හැකි වීම.

අභියෝග

1. පාරිභෝගික සේවා අධිකාරියේ අදාළ සේවාවන් සැපයීමේ දී ප්‍රමාණවත් නිලධාරීන් ප්‍රමාණයක් නොමැති වීම.

2. මිනුම් ඒකක ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව හා බුද්ධිමය දේපළ කාර්යාලීය කටයුතු ඉටු කිරීමේ දී අවශ්‍ය තාක්ෂණික පහසුකම් අවම වීම.

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	41	31	10	
තෘතියික	12	01	11	
ද්විතීයික	135+174*	171		36
ප්‍රාථමික	39	28	11	
තාවකාලික	08	03	05	
එකතුව	235+174*	234	37	36
			01	

* ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට අනුමත සංවර්ධන නිලධාරී තනතුරු (අංක 2297/78 හා 2022.09.16 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතට පවරා ඇත)

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

ඉහත සටහනට අනුව අදාළ වර්ෂය වනවිට වෙළෙඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ තනතුරු බොහොමයක් පුරප්පාඩු වී තිබීම හා ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීමේදී පුහුණු ශ්‍රමය නොමැතිකම අභියෝගයක්ව ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරනලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	85 (සංවර්ධන නිලධාරීන්)	පැය 150	225,000		දේශීය	රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට අවශ්‍ය දෙමළ භාෂා පුහුණුව
02	ඵලදායීතා සංකල්පය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	8	දින 05	64,000		දේශීය	ඵලදායීතා සංකල්පය පිළිබඳ දැනුම
03	ගබඩා කළමණාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව	1	පැය 06	9,000		දේශීය	ගබඩා කළමණාකරණය පිළිබඳ දැනුම

04	ව්‍යාපෘති වාර්තා සකස් කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව	20	පැය 12	14,000		දේශීය	ව්‍යාපෘති වාර්තා සකස් කිරීම පිළිබඳ දැනුම
05	රාජ්‍ය වැටුප් පද්ධති පිළිබඳ පුහුණු පාඨමාලාව	03	දින 03	18,000		දේශීය	රාජ්‍ය වැටුප් පද්ධති සකස් කිරීම පිළිබඳ දැනුම
06	අභ්‍යන්තර විගණනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	මාස 03	20,000		දේශීය	අභ්‍යන්තර විගණනය පිළිබඳ දැනුම
07	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම පිළිබඳ එක් දින පුහුණු පාඨමාලාව	02	පැය 08	10,000		දේශීය	කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම පිළිබඳ දැනුම
08	විනය කාර්යය පටිපාටිය පිළිබඳ එක් දින පුහුණු පාඨමාලාව	60	පැය 08	4,000		දේශීය	විනය කාර්යය පටිපාටිය පිළිබඳ දැනුම
09	මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වූ විදේශීය පුහුණු පාඨමාලා	223			නොමිලේ	විදේශීය	සංවර්ධනය හා නවෝත්පාදනයන් පිළිබඳ දැනුම

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ.)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	මෙම අමාත්‍යාංශයේ මෙම අත්තිකාරම් ගිණුම් නොපවතී	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.6	**වෙනත්**	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන ගිණුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GA – N20) යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ . 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරි වරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ . 134(2) DMA/1-2020 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		

6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2020 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කම්ප්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

9.2	වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම.	අනුකූල නොවේ	පෙර වර්ෂයේ පැවති ඉන්ධන හිඟය හා කෝටා ක්‍රමය හේතුවෙන්	2023 වර්ෂයේ ඉන්ධන පරිභෝජනය සිදු කිරීමට ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ අදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා එවකට පැවති සේවා අවශ්‍යතාවය මත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් කාර්ය මණ්ඩල අනුයුක්ත කර ඇත.	අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩල පවත්වාගෙන යාමට කටයුතු කිරීම.
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		

16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		